සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development
කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - සමාජ ආරක්ෂණ අංශය
மகளிர், சிறுவர் அலுவல்கள் மற்றும் சமூக பாதுகாப்பு அமைச்சு - சமூகபாதுகாப்பு பிரிவு
Ministry of Women, Child Affairs and Social Security – Social Security Division

මගේ අංකය / எனது இல / My No: DSD/HO/DG/චක්‍රලේඛ

ඔබේ අංකය / உமது இல / Your No: ............................................

දිනය / திகதி / Date: 2020.06.11

දිස්ත්‍රික් ලේකම්/දිස්ත්‍රික් සමෘද්ධි අතිරේක අධ්‍යක්ෂ ජනරාල්,

දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය ලේකම්,

දිස්ත්‍රික් සමෘද්ධි නියෝජ්‍ය හා සහකාර අධ්‍යක්ෂ,

ප්‍රාදේශීය සමෘද්ධි මූලස්ථාන කළමනාකරු,

සමෘද්ධි බැංකු සමිති කළමනාකරු හා බැංකු කළමනාකරු,

සමෘද්ධි සංවර්ධන නිලධාරි,

**<u>සමාජ ප්‍රතිලාභ වැඩසටහන යටතේ රුපියල් 5000/-ක දීමනාව හා සමෘද්ධි සහනාධාර ගෙවීම.</u>**

කෝවිඩ් - 19 වෛරස තත්ත්වය හේතුවෙන් සමෘද්ධි සහනාධාරලාභීන් ඇතුළු ජීවනෝපාය මාර්ග අහිමි වූ කණ්ඩායම් සඳහා අදියර 02ක් යටතේ රුපියල් 5000/-ක සමාජ ප්‍රතිලාභ දීමනා ගෙවීම් සිදු කර ඇත.

**02.** දෙවන අදියර ක්‍රියාත්මක කිරීම සඳහා මුදල් ප්‍රේෂණය කිරීම අවස්ථා කිහිපයක දී සිදු කළ අතර අවශ්‍ය කරන අක් මුදල් සපයා ගැනීම පිළිබඳ උපදෙස් හා මඟපෙන්වීම් සමාංක දරණ 2020.06.03 දිනැති චක්‍රලේඛය මඟින් ලබා දී ඇති අතර 2020.05.18 දින සිට ආරම්භ කළ මෙම ගෙවීම් 2020.06.16 දින වන විට අවසන් කළ යුතු ය.

**03.** සමාජ ප්‍රතිලාභ දීමනා ගෙවීමේ දී ඉතිරි වූ මුදල් ප්‍රධාන කාර්යාලයේ නිල ගිණුමට තැන්පත් කරන ලෙස දැනුම් දී තිබූ අතර එය ඉතා මන්දගාමී ස්වරූපයකින් සිදු වී ඇත. එම තත්ත්වය සැලකිල්ලට ගෙන 2020 ජූනි මස සහනාධාර මුදල් සමෘද්ධි බැංකු වෙත ප්‍රේෂණය කිරීමේ දී අදාල ගැලපීම් සිදු කර ඇත.

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaramulla

| | අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General | අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment) | ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant | අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance) | කාර්යාලය / அலுவலகம் / Office |
|---|---|---|---|---|---|
| Tel- | 011-2871672/2872202 | 011-2873799 | 011-2869742 | 011-2889003 | 0112872202 |
| Fax - | 011-2889002 | 011-2873996 | 011-2869742 | 011-2887469 | |
| E-mail- | dgsamurdhi@.gov.lk | diradmin@samurdhi.gov.lk | finance@samurdhi.gov.lk | | |
| | | Hot Line :0112-889007 | | Hot Line:0112-885582 | Hot Line: 011- 2887722 |

**04.** ඒ අනුව **"සමෘද්ධි සහනාධාර දීමනා අරමුදලින් ගණුදෙනුකරුවන්ගේ තැන්පත් ගිණුම් වලට බැර කළ යුතු අරමුදල් ගිණුමට" (කේත අංකය 4038)** බැර පිණිස ප්‍රේශණය කරන ලද මුදල ප්‍රමාණවත් නොවන්නේ නම් **"සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් ප්‍රතිපූර්ණය කරගත යුතු අඩු ආදායම්ලාභීන්ට ගෙවන ලද සමාජ ප්‍රතිලාභ දීමනා ගිණුමට" (කේත අංකය 3319)** "හර" කර සමෘද්ධි සහනාධාරලාභීන්ගේ තැන්පත් ගිණුම් වලට "බැර" කිරීමට කටයුතු කළ යුතු ය.

**05.** 2020.05.17 දිනැතිව අංක DSD/HO/05/MF/2020/5/i හා ii දරන චක්‍රලේඛ අනුව සමෘද්ධි බැංකුවේ තැන්පත් ගිණුමක් නොමැති සමාජ ප්‍රතිලාභ දීමනා ගෙවන ලද සියළු දෙනාහට සමාජික නොවන හෝ වෙනත් තැන්පත් ගිණුමක් ආරම්භ කරන ලෙස උපදෙස් ලබා දී තිබුණි. මෙම තැන්පත් ගිණුම් විවෘත කිරීම 2020.06.22 දිනට පෙර අවසන් කළ යුතු බව දන්වමි. ඉදිරියේ දී ලබා දෙන ප්‍රතිලාභ හා වෙනත් කටයුතු වල දී මෙය ඉතා වැදගත් හා අත්‍යාවශ්‍යය වන බව වැඩිදුරටත් සඳහන් කරමි.

ආර්.පී.බී.තිලකසිරි
අධ්‍යක්ෂ ජනරාල්

**පිටපත් :-**

1. ලේකම්, කාන්තා, ළමා කටයුතු සහ සමාජ ආරක්ෂණ අමාත්‍යාංශය - කා.දැ.ස
2. රාජ්‍ය ලේකම් ,සමාජ ආරක්ෂණ අංශය - කා.දැ.ස.
3. ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
4. අධ්‍යක්ෂ, ක්ෂුද්‍ර මූල්‍ය , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස
5. සියළුම අංශ ප්‍රධානීන් , සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව - අ.ක.ස